# 6.3.3.2 කෝට්ටේ යුගයේ
# අධ්‍යාපනය හා සාහිත්‍යය




නිපුණතාව - 6

# කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය

## අධ්‍යාපනය

හයවෙනි පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ අධ්‍යාපනයේ විශාල දියුණුවක් ඇති වූ කාල වකවානුවකි. මේ කාලයේ අධ්‍යාපනය දියුණු වීමට බලපෑ සාධක කීපයකි.

- ඉතා සාමකාමී කාල වකවානුවක් වීම.
- පිරිවෙන් රාශියක් ආරම්භ වීම.





අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අධ්‍යාපනයට බල පෑ හේතු කිහිපයක් සඳහන් කළ හැක.

- මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල භික්ෂූන් වහන්සේලා විශාල ශාස්ත්‍රීය සේවයක නිරත වූහ.
- වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා තරගයට මෙන් ග්‍රන්ථකරණයේ නියැළීම නිසා විශාල සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති විය.
- පැවිදි උගතුන් පමණක් නොව ගිහි උගතුන්ද ග්‍රන්ථකරණයේ නියැලීම අධ්‍යාපනයේ දියුණුවට බලපා ඇත.
- එසේ ම රටේ පාලකයා ග්‍රන්ථකරණයේ නියැලී ඇත.
- මෙකල පැවති අධ්‍යාපන මධ්‍යස්ථාන ජාත්‍යන්තර කීර්තියට පත්ව තිබූ බැවින් සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරති පඬිවරයා දිවයිනට පැමිණීම මෙකල සිදුවිය. එතුමාද ග්‍රන්ථ 3ක් කර තිබීම විශේෂිත ය.
- අධ්‍යාපන මධ්‍යස්ථානවල විෂය ගණනාවක් ඉගැන්විය




Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සාහිත්‍යය

කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ප්‍රබෝධමත් යුගයකි. එය සිංහල සංදේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ද වේ. කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු ගණනාවකි.

- පිරිවෙන්වලින් පැතිරුණ ප්‍රබෝධය
- පැරකුම් රජු යටතේ රට එක්සේසත් වීමෙන් උදා වූ සාමය
- රටේ තිබූ සෞභාග්‍යය
- සාහිත්‍යයට රාජ්‍ය අනුග්‍රහය ලැබීම

- පැවිදි උගතුන් සාහිත්‍යකරණයේ නියැලීම
- ගිහි උගතුන් සාහිත්‍යකරණයේ නියැලීම
- රටේ පාලකයන් පොත පත ලිවීම
- විදේශිකයන් ද පැමිණ පොත් ලිවීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## කෝට්ටේ යුගයේ සාහිත්‍යයේ ප්‍රධාන ලක්ෂණ ගණනාවක් හඳුනා ගත හැකි ය.

- පද්‍ය ග්‍රන්ථ බහුල වීම.
- සංදේශ කාව්‍යයේ නැගීම.
- ගද්‍ය ග්‍රන්ථ විරල වීම.
- එළිසම කාව්‍ය දියුණු වීම.

| | |
|---|---|
| මුල් ම ප්‍රශස්ති කාව්‍යය බිහි වීම. | පැරකුම්බා සිරිත. |
| මුල් ම සිංහල ශතක කාව්‍යය බිහි වීම. | උදා :- එළු සිලෝ ශතකය. |
| ද්‍රවිඩයන් සිංහල කෘති කිරීම. | උදා :- නාමාවලිය |
| පළමු එළිසම මහ කාව්‍ය බිහි වීම. | උදා :- පියුම්මල |
| ද්‍රවිඩ කතාවක් රැගත් පළමු කෘතිය බිහි වීම. | උදා :- වයන්තිමාලය |
| පළමු නිසන්තු ගී කාව්‍යයක් බිහි වීම. | උදා :- රුවන්මල |

කෝට්ටේ යුගයේ රචිත සාහිත්‍ය ග්‍රන්ථ වර්ග කීපයකට බෙදා දැක්විය හැකි ය.





අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සංදේශ කාව්‍යය

කෝට්ටේ යුගය සාහිත්‍ය පෝෂණයට සංදේශ කාව්‍යවලින් ඉටු වූ මෙහෙය අති විශාල ය.

### පරෙවි සංදේශය





තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ පළමු කෘතිය වේ. මෙකල සිටි ප්‍රකට ම කවියා උන්වහන්සේ වූහ.

හයවන පරාක්‍රමබාහු රජුගේ වැඩිමහල් දියණිය වූ චන්ද්‍රාවතී කුමරියට සැමියෙකු හා පුතෙකු පතමින් දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙත යැදීමට ග්‍රන්ථය රචනා කර ඇත.

### සැළලිහිණි සංදේශය

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිතය. උලකුඩය දේවියට පුතෙකු යදිමින් රජුගේ 35 වැන්නේ ලියූ සැළලිහිණිය කෙටි රසවත් කාව්‍යයකි. විභීෂණ දෙවියන් යදින මෙය සුන්දර ගඟුලැල්ලක් වැනි ය.





### කෝකිල සංදේශය


දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙන්පති හිමියන් රචිතය.යාපනය ජයගත් සපුමල් කුමරුට සෙත් පැතීම මෙහි අරමුණ වී ඇත.ඔහු ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා උපුල්වන් දෙවියන් වෙත යැවූ පණිවිඩයක ආකාරයෙන් රචනා කර ඇත.

### ගිරා සංදේශය

කර්තෘ අවිනිශ්චිතය. II පරාක්‍රමබහු රජුට හා මැති ඇමැතිවරුනට සෙත් පතා ලියා ඇත.



### හංස සංදේශය




වීදාගම මෛත්‍රිය හිමියන් විසින් රචිත ය. VI වන පැරකුම්බා රජුට සෙත් පතමින් රතන සූත්‍රයෙන් ලක්ෂ වාරයක් පිරිත් කියන ලෙස ඉල්ලා කැරගල වනරතන හිමියන් වෙත යැවූ හසුනක ආකාරයෙන් රචනා කර තිබේ. මෙම ග්‍රන්ථයෙන් දේව ආරක්ෂාව පැතීමට වඩා බුදුදහමේ එන පිරිත් දේශනාව වැනි ධර්ම කොටස්වලින් ලැබිය හැකි ආරක්ෂාව ප්‍රබල බව පෙන්වා දෙයි.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 12 ශ්‍රේණිය

| | |
|---|---|
| ගුත්තිල කාව්‍යය | වැත්තෑවේ හිමියන් විසින් රචිත ය. ගුත්තිල ජාතකය පදනම් කරගෙන ලියා ඇත. |
| කාව්‍යශේඛරය | ශ්‍රී රාහුල හිමියන් විසින් රචිතය. සත්තුභත්ත ජාතකය පදනම් කරගෙන ලියා ඇත. සිංහල සාහිත්‍යයේ දෙවන මහා කාව්‍යය වේ. |
| ලෝවැඩ සඟරාව | වීදාගම හිමියන් රචිත ය. උපදේශ කාව්‍යයකි. මිනිසා විසින් පරලොව ජීවිතය යහපත් කර ගත යුතු ආකාරය පිළිබඳ ධර්ම උපදේශ සහිත ය. |
| චූල බෝධි වංශය | වීදාගම හිමියන් රචිත ය. වංශකතා ගණයට අයත් වේ. |
| එළුසිලෝ ශතකය | සිංහල සිව්පද කාව්‍යයකි. මුල, මැද, අග, එළිසම පිහිටුවා ඡන්දස් අලංකාර සහිතව ලියා ඇත. |
| පැරකුම්බා සිරිත | VI වැනි පරාක්‍රමබාහු රජුගේ ප්‍රෞඪත්වය හා ඓශ්වර්ය වර්ණනා කරමින් ලියා ඇත. කර්තෘ අවිනිශ්චිත ය |
| කුවේණි අස්න | අස්න කාව්‍යයකි. විජය පුරාවෘත්තය කවියට නගා ඇත. |
| පඤ්චිකා ප්‍රදීපය | ව්‍යාකරණ ග්‍රන්ථයකි. තොටගමුවේ රාහුල හිමියන් රචිත ය. |
| කඨිනානිසංශය | ධර්ම ග්‍රන්ථයකි. කඨින පින්කමෙහි අනුහස් පිළිබඳ ලිය වී ඇත. |
| බුදුගුණ අලංකාරය | දේවවාදී සංකල්පය හෙවත් භක්තිවාදය උපහාසයට ලක් කරමින් හා දෙවියන් පිදීමේ නිසරු බව පෙන්වා දෙමින් ලියා ඇත. වීදාගම මෛත්‍රී හිමියන් රචිත ය. |
| සද්ධර්ම රත්නාකරය | ධර්ම ග්‍රන්ථයකි. ධම්මදින්න හිමියන්ගේ කෘතියකි. |
| ලෝකෝපකාරය | රණස්ගල්ලේ හිමියන් රචනා කර ඇත. උපදේශ කව්‍යයකි. |

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එච්.එම්.හර්ෂනි මදුශානි මෙනවිය , ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරික්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

| රුවන්මල් නිඝණ්ඩුව | → | vi වෙනි පරාක්‍රමබාහු රජුගේ කෘතියකි. |
|---|---|---|
| පුරාණ නාමාවලිය | → | පැරණි බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ නාමාවලියකි. නන්තුර්තුනයාර් රචිත ය. |

භක්ති ශතකය
වෘත්තමලා ව්‍යාඛ්‍යානාව
වෘත්ත රත්නාකර පඤ්චිකාව
} ශ්‍රී රාමචන්ද්‍ර භාරති නම් පඬිවරයා විසින් සංස්කෘත බසින් ලියා ඇති ග්‍රන්ථ 3 කි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk